# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 60 දරන කොට්ටාව ශ්‍රී පුණ්‍යාභිවර්ධනාරාම විහාරස්ථාන කාර්යසාධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ඔක්තෝබර් මස 23 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 5.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2009 අංක 60 දරන කොට්ටාව ශ්‍රී පුණ්‍යාභිවර්ධනාරාම විහාරස්ථාන කාර්යසාධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 21 වන දින]

එල්. ඩී.— ඕ. අයි. එන්. සී. 10/2007.

**කොට්ටාව ශ්‍රී පුණ්‍යාභිවර්ධනාරාම විහාරස්ථාන කාර්යසාධන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"කොට්ටාව ශ්‍රී පුණ්‍යාභිවර්ධනාරාම විහාරස්ථාන කාර්යසාධන සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක් එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද එකී සමිතිය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 60 දරන කොට්ටාව ශ්‍රී පුණ්‍යාභිවර්ධනාරාම විහාරස්ථාන කාර්යසාධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) කොට්ටාව ශ්‍රී පුණ්‍යාභිවර්ධනාරාම විහාරස්ථාන කාර්යසාධන සමිතියේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "කොට්ටාව ශ්‍රී පුණ්‍යාභිවර්ධනාරාම විහාරස්ථාන කාර්යසාධන සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබාගැනීමේ ද පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. කොට්ටාව ශ්‍රී පුණ්‍යාභිවර්ධනාරාම විහාරස්ථාන කාර්යසාධන සමිතිය සංස්ථාගත කිරීම.

2—PL 004150—2,650 (2009/07)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) විහාරස්ථානයේ ආරක්ෂාව, නඩත්තුව හා වර්ධනය සහතික කරලීම;

(ආ) නේවාසික භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව සහතික කරලීම හා ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරාලීමට කටයුතු කිරීම ;

(ඇ) විහාරස්ථානයේ ආගමික, සාමාජික, ආර්ථික වර්ධනයට හේතුවන ක්‍රියාකාරකම් සඳහා සහයෝගය දීම;

(ඈ) බුදුදහමේ ස්ථිර පැවැත්ම සඳහා කටයුතු කරන අතරම බෞද්ධ සදාචාරාත්මක අගයන් පදනම් කර ගනිමින් පන්සිල් රකින සමාජයක් බිහි කිරීමට කටයුතු කිරීම;

(ඉ) බෞද්ධ විහාරස්ථානයකින් අපේක්ෂිත සියලු පරමාර්ථ ඉටු කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම;

(ඊ) අනාථ, ආබාධිත, මහළු, ගිලන් සහ අවතැන් වූ බෞද්ධාගමික පුද්ගලයන්ගේ සුභසාධනය, පුහුණුව සහ පුනරුත්ථාපනය සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම ;

(උ) බෞද්ධාගම සම්බන්ධයෙන් වූ පොත්, වාර්තා, සඟරා සහ වෙනත් සාහිත්‍ය නිර්මාණ පළකිරීම හෝ පළකිරීමට සැලැස්වීම සහ පුස්තකාල, පොත් සාප්පු සහ මුද්‍රණාල පිහිටුවා පවත්වාගෙන යාම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු, සභාපති විය යුතු විහාරාධිපති වහන්සේ සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන හෝ පත් කරගනු ලබන උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ කාරක සභිකයන් පස් දෙනකුගෙන් සමන්විත (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින්, 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සමිතියේ කළමනාකරණ මණ්ඩලයේ ධුර දරමින් සිටි සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ හෝ ඉන් එක් පරමාර්ථයක් වැඩි දියුණු කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම, සඳහා අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීම, ඉටුකිරීම හා ක්‍රියාත්මක කිරීම ඇතුළු පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍යවන යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නීයාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම් වලට හෝ කොන්ත්‍රාත්තුවලට කෙලින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් ඇතුළත්වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍ය වලින් ත්‍යාග, පරිත්‍යාග හෝ රික්තවරණ භාරගැනීම;

(ඈ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, සහ යම් බැංකුවක ජංගම තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම;

(ඉ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යයි සංස්ථාව විසින් සඳහන් කරනු ලබන ආකාරයට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇප මත ණයට ගැනීම හෝ ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වා ගෙන යාම.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවට සාමාජිකයන් ඇතුළු කරගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම, මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම සහ මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා විධිවිධාන සලස්වන රීති ඇතුළු සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) සංස්ථාව විසින් සාදනු ලබන සෑම රීතියක්ම, (1) වන උප වගන්තිය යටතේ එවැනිම රැස්වීමකදී එවැනිම ආකාරයට සාදන ලද රීතියක් ලෙස සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හිම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු, ප්‍රදාන හෝ මූල්‍ය ආයෝජන වශයෙන් මේ දක්වා ලැබූ හෝ මින්මතු සංස්ථාවට ලැබෙන හෝ සියලු මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා යම් අගය ක්ෂයවීමේ අරමුදලක්, සංචිත හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය හා ගිණුම්.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද සාමාජිකයන්ගෙන් යුත් එවැනි ගණකාධිකාරී සමාගමක් අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, සංස්ථාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙන ලද තැනැත්තකු ඉදිරිපිටදී හැර කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි ඔවුන් විසින් තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු සහ සමිතියට අයවිය යුතු ණය මුදල්.

10. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සමිතිය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සමිතියට අයවිය යුතු සියලු ණය, සමිතියට ගෙවිය යුතු සම්මාදම් මුදල් සහ දායක මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

11. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති වලට යටත්ව සංස්ථාවේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරිවී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ ලාභයක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

14. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.